# ශ්‍රී ලාංකේය සමාජයේ බිඳ වැටෙන සාරධර්ම පද්ධතිය ගොඩ නැඟීමෙහි ලා බෞද්ධ දර්ශනයේ ඉගැන්වෙන සාරධර්ම අධ්‍යාපනයේ උපයෝගීතාවः න්‍යායාත්මක එළඹුමක්

(මෙත්ත සූත්‍රය ඇසුරින්)

පූජ්‍ය, පුවක්පිටියේ හේමාලෝක හිමි[1]

### හැඳින්වීම

අරමුණු හා පරමාර්ථවලින් යුත් අන්‍යොන්‍ය බැඳීමක් ඇති පුද්ගලයන් දෙදෙනකුට වැඩි පිරිසකගෙන් යුත් සමූහය සමාජය ලෙස සරලවම විග්‍රහ කරගත හැකි ය. දීර්ඝකාලීන ව විවිධ සංස්කරණයන්ට ලක් වූ ලාංකේය සමාජය බහු ජනවාර්ගිකත්වය සහ බහු සංස්කෘතීන්ගේ සඞ්කලනයකින් සැදුම් ලද්දකි. තත් සමාජයේ හරය ලෙස සිංහල බෞද්ධ සංස්කෘතිය වටා අනෙකුත් සංස්කෘතීන් ගොනුව ඇත. වසර දෙදහස් පන්සීයකටත් වඩා පැරණි ඉතිහාසයක පදනමක් ඇති ලාංකේය සමාජය වර්තමානය වන විට සාරධර්මවලින් ඈත් වෙමින් සංස්කෘතික වශයෙන් මෙන් ම සමාජමය වශයෙන් ද බිඳ වැටෙන ලක්ෂණ පෙන්නුම් කරයි. ලාංකේය සමාජයේ බිඳවැටෙන සාරධර්ම පද්ධතිය යළි ප්‍රතිෂ්ඨාපනය කිරීමට මෙත්ත සූත්‍රාගත න්‍යායික එළඹුම, පුද්ගල චරිතාභ්‍යන්තරීකරණ ප්‍රායෝගික ක්‍රියාවලියක අවශ්‍යතාව බෙහෙවින් වැදගත් වේ.

### පර්යේෂණ අරමුණු

ලංකා සමාජයේ බිඳ වැටෙන සාරධර්ම පද්ධතිය ප්‍රතිසංවිධානය කිරීමේ දී ථෙරවාද බෞද්ධ දර්ශනයට වර්තමානයේ සපයන වැරදි අර්ථකථන හඳුනා ගැනීම සහ නිර්මල ථෙරවාද බෞද්ධ දර්ශනයේ ඉගැන්වීම් අධ්‍යාපන පද්ධතියේ ප්‍රගමනය උදෙසා ප්‍රයෝගික ව භාවිත කිරීම යි.

### පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සිදු කිරීමේ දී පහත මූලාශ්‍රය අධ්‍යයනය කිරීම සිදු කෙරේ.

I. ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය
II. ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනය
III. පරිවාර උපලේඛන අධ්‍යයනය

### පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලාංකේය සමාජයේ සාරධර්ම පද්ධතිය බිඳ වැටෙන ආකාරය හා එය ගොඩ නැඟීමට මෙත්ත සූත්‍රයේ උපයෝගීතාව කෙසේ ද?

### පර්යේෂණ සාහිත්‍යයික විමර්ශන

ප්‍රධාන වශයෙන් ත්‍රිපිටකය හා අටුවාව ඇසුරින් මෙත්ත සූත්‍රය පිළිබඳ ගෙනෙන විග්‍රහය කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. මෙත්ත සූත්‍රයේ අන්තර්ගත ධර්මකරුණු, සාරධර්ම අධ්‍යාපනය සහ ලංකා

1. අධ්‍යාපන විද්‍යා අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. *hemaloka95@gmail.com*

සමාජය පිළිබඳ ලියවුණු අධ්‍යාපනික හා සමාජවිද්‍යාත්මක පර්යේෂණ, ලිපිලේඛන හා නිබන්ධ කෙරෙහි අවධානය යොමු කෙරේ.

**පර්යේෂණ සීමාව**

බුද්ධාගම සහ අධ්‍යාපනය තේමාවට අයත් ව සිදු කරන මෙම පර්යේෂණය සිදු කිරීමේ දී හැඳින්වීම, පර්යේෂණ පරමාර්ථය, පර්යේෂණ ක්‍රමවේදය, පර්යේෂණ ගැටලුව, පර්යේෂණ සාහිත්‍යයික විමර්ශන, පර්යේෂණ සාකච්ඡාව, ප්‍රමුඛ පද, පර්යේෂණ නිගමනය, පර්යේෂණ යෝජනා සහ මූලාශ්‍රය භාවිතය ආදී ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් පර්යේෂණය සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

**පර්යේෂණ සාකච්ඡාව**

ගෝලීයකරණය නිසාවෙන් ලෝකය එක යායක් බවට පත්ව ඇත. නවීන තාක්ෂණයේ ව්‍යාප්තිය සමඟ සෑම සමාජයක ම විප්ලවීය වෙනස්කම් රාශියක් සිදු වෙමින් පවතින යුගයක සමාජ හරපද්ධතියට වඩා මුදලට බලයට අගයන් ලැබීම නිසා ලංකා සමාජයේ බොහෝ සංස්ථාවල පරිහානිය පෙනෙන මානයට ම පැමිණ ඇත. කුඩා ම සමාජ සංස්ථාව වන පවුල තුළ ස්වාමි-භාර්යා, දූදරු දෙමාපිය අන්තර්සබඳතා බිඳවැටී මූලික සාරධර්මවලින් ද වියුක්තව පුද්ගලයා කටයුතු කරයි. අධ්‍යාපනික ආයතන, ආගමික ආයතන, දේශපාලනික ආයතන, පරිපාලන ආයතන ආදී සෑම තැනක ම සාරධර්ම පරිහානියට පත්ව තිබේ. ලංකාව වැනි බහු සංස්කෘතික රටක ජාතීන් ආගම් හා සංස්කෘතීන් අතර ද ගැටුම් උග්‍ර වන්නට හේතුව වී ඇත්තේ ද උසස් ගතිගුණ පරිහානිය යි. සෑම ශිෂ්ටසම්පන්න සමාජයක ම අඛණ්ඩ වූ සමෝධානික පැවැත්ම හා වර්ධනය දැකිය නො හැකි අතර, කාලානුක්‍රමික ව වෙනස්වීම්වලට ලක්වීම ස්වාභාවික ය. එවන් සමාජයක බිඳවැටෙන සමාජ සංයුතීන් ගොඩ නැඟීම අධ්‍යාපන ක්‍රියාවලියෙන් අපේක්ෂා කෙරේ.

බාල පරම්පරාවට සංස්කෘතික හා සමාජමය වටිනාකම් හා අගයන් සම්ප්‍රේෂණය කිරීම අධ්‍යාපනයේ කාර්යයකි. එමඟින් චර්යාපද්ධතියේ ඇතිවන වෙනස්කම් බෙහෙවින් වැදගත් වේ. විෂයමාලා සංවර්ධනයේ දී එහි ආකෘතිවල ද දැනුම, ආකල්ප හා කුසලතා පදනම් කරගත් අඬගයන් පිළිබඳ විශේෂ අවධානයක් දක්වන්නේ සාරධර්ම ගොඩ නැඟීමට ය. 'හරවත් ධර්ම', 'උසස් ගතිගුණ', 'වටිනාකම්', 'අගයන්' ආදිය සාරධර්ම යන්නට පර්යාය පද වේ. ගුණවත් හා නැණවත් මිනිසා රටකට ධනනිධානයකි. විෂය නිර්දේශයකට අනුව දැනුම ලබාදීමෙන් නැණවත් පුද්ගලයෙක් ද සාරධර්ම අධ්‍යාපනය වඩා ප්‍රායෝගිකත්වයකින් ඉගැන්වීමෙන් ගුණවත් පුද්ගලයෙක් ද බිහි කළ හැකි ය. සාරධර්ම පුද්ගල චරිතවත්භාවයේ කැඩපත යි. උද්ග්‍රහණයෙන් පමණක් නො ව භාවිතයෙන් චරිතායනය කරගත යුත්තකි. සෑම ආගමික සංස්කෘතියක ම සාරධර්ම පද්ධතියක් දැකිය හැකි අතර, බෞද්ධ සංස්කෘතිය ප්‍රමුඛ කරගත් ලාංකේය සංස්ථාගත එම හරපද්ධතීන් අධ්‍යාපන ක්‍රියාවලියේ දී ප්‍රායෝගිකව චරිතායනයෙන් ලාංකික සමාජය ගොඩ නැඟීමට ප්‍රබල පිටුවහළක් වේ.

වර්තමාන ලාංකේය සමාජයේ සිරිත් විරිත් පිළිබඳ වැරදි අර්ථකථන රාශියක් ස්මතු ව ඇත. සිරිත් විරිත් පරිහානිය වෙමින් සඞ්කර සමාජයක ලක්ෂණ පෙන්නුම් කරයි. එයට එක් හේතුවක් ලෙස සාරධර්ම පරිහානිය හඳුනා ගෙන ඇත. සාරධර්මවලින් වියුක්ත වූ තැන එම සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට

බලපෑම් සිදු වේ. එකී තත්ත්වය වෙනස් කර ගැනීම උදෙසා ඍජු ව ම බෞද්ධ දර්ශනය උපයෝගී කරගත හැකි ය. ඒ සඳහා යාගයක් මෙන් නිතර නිතර සඞ්ගායනාව පමණක් ප්‍රමාණවත් නො වේ. මෙත්ත සූත්‍රාන්තර්ගතය දෙස අවධානය යොමු කිරීමෙන් ඒ බව සක්සුදක් සේ පැහැදිලි වේ. " **කරණීයමත්ථකුසලෙන - යං තං සන්තං පදං අභිසමෙච්ච**" ආරම්භක පාඨය විසන්ධි කොට අර්ථ විමසූ විට "**කරණීයං අත්ථකුසලෙන යං තං සන්තං පදං අභිසමෙච්ච** - නිවනට පැමිණීමට කැමති අර්ථයෙහි (ප්‍රතිපදාවෙහි) දක්ෂයා විසින් කළයුතු දේ" පිළිබඳ සිදු කරන විස්තරයක් මෙහි අන්තර්ගත වේ. එසේ නම් මෙම සූත්‍රයේ ඉගැන්වෙන කරුණු සඞ්ගායනාව උදෙසා වූවක් නො වේ. එය සිදු කළ යුතු දෙයකි. '**කරණීයං**' පදයෙන් එය තීව්‍ර කොට ඇත. නිවන උදෙසා වන ආර්යමාර්ගික ප්‍රතිපදාවන් හා සාරධර්මවල ඇත්තේ අවියෝජනීය බැඳීමකි. සාරධර්ම වූ කලී නිවන සඳහා වන ප්‍රතිපදාවන්ගේ මූලික අවස්ථා ලෙස ද හැඳින්විය හැකි ය.

බෞද්ධ දර්ශනයේ පෙන්වා දෙන සෑම ධර්මකරුණක් ම සමාජ සුභසිද්ධිය උදෙසා වන සාරධර්ම හා බැඳේ. හේතුඵලවාදී ඉගැන්වීමක් වන බෞද්ධ දර්ශනය අවිහිංසාවාදී, සමාජ හිතකාමී, සාමකාමී පුද්ගලයෙකු නිර්මාණයට අවශ්‍ය න්‍යායික හා ප්‍රායෝගික ප්‍රතිපත්ති මාලාවකින් සමන්විත ය. ඒ අතරින් මෙත්ත සූත්‍රය මෛත්‍රී කිරීම හා බැඳුණු හරවත් ධර්මරාශියක් අන්තර්ගත ධර්මවිග්‍රහයකි. මෙත් වැඩීම වූ කලී කුලය, වර්ගය, වර්ණය, ජාතිය, ගෝත්‍ර මත පදනම්ව වෙනස් නො වන්නකි. සූත්‍රාගත හරයෙන් ම පෙන්වා දෙන්නේ මනුෂ්‍යත්වය හා බැඳී සාරධර්ම විවරණයකි. සංවේදී බව, කාරුණිකභාවය, චාම් සරල ජීවන රටාව **(සල්ලහුකවුත්ති)**, සාමකාමී ව ජීවත්වීම, අන්‍යයන් ඇගයීම, මානව එක්සත් බව, සත්‍යවාදී බව, ප්‍රජාතන්ත්‍රික ලෙස තීන්දු තීරණ ගැනීම, කෘතඥ බව, සමානත්වය, අධිෂ්ඨානය, සහෝදරත්වය, සහයෝගීතාව, අවඞ්කභාවය **(උජු, සූජු)**, බෙදා හදා ගැනීම, සමාජ සේවය, මෛත්‍රීසහගත බව, ආගන්තුක සත්කාරය, සමානත්වය, ත්‍යාගශීලී බව, පිරිසිදුකම (ලෞකික හා ආධ්‍යාත්මික වශයෙන්) **(සීලවා)**, අන්‍ය මත ඉවසීම, ස්වශක්තිය **(සක්කො)**, අනලස් බව, සහජීවනය, යුතුකම් හා වගකීම් ඉටුකිරීම ආදි වූ සාරධර්ම රාශියක් ත්‍රිපිටකාගත මෙත්ත සූත්‍රයෙන් විග්‍රහ කෙරේ.

බෞද්ධ දර්ශනයේ පෙන්වා දෙන මෙවන් සාරධර්ම සඞ්ග්‍රහයක් සඞ්ගායනාවට පමණක් වෙන් වූවක් නො ව ප්‍රායෝගිකත්වයෙන් භාවිත කළ යුත්තක් ලෙස ගත යුතු ය. වර්තමාන සමාජ ක්‍රමය මනුෂ්‍යත්වය ඡේදනය කළ සංස්කෘතික ව ගොඩ නැගූ සාම්ප්‍රදායික ව්‍යාජත්වයෙහි මිනිසුන් මුළා කොට ඇත. මනුෂ්‍යත්වයේ අක්මුල් සිඳ දැමූ ලෝකයක බිඳී ගිය හදවත් එකතු කරන කර්තව්‍යය සාරධර්ම අධ්‍යාපනය හා බැඳේ. සමාජ සංස්ථා, ජාතීන් හා ආගම් මෙන් ම දේශ දේශාන්තර ව අතර ඇතිවන අන්තර් හා බාහිර ගැටලු විසර්ජනය උදෙසා මෙත්ත සූත්‍රාගත සාරධර්ම චරිතායනය කර ගැනීම බෙහෙවින් වැදගත් වේ. ආර්ථික, දේශපාලනික, ආගමික, සමාජයීය සියලු අංශවල මානවදාමය ශක්තිමත් කිරීම උදෙසා මානව හදවත්වල මානවීයත්වය වර්ධනය කරන්නට සාරධර්ම ඉගැන්වීම සමකාලීන සමාජමය අවශ්‍යතාවකි. ආගම්වාදය, ජාතිවාදය, වර්ගවාදය මත පදනම් ව සමාජ ගැටලු උග්‍ර වන්නට සාරධර්ම අධ්‍යාපනය බිඳ වැටීම හේතු වී ඇත. බල අරගලය හා ධන අරගලය තුළ මනුෂ්‍යත්වය විනාශවන වර්තමාන සමාජ ක්‍රමය තුළ වටිනාකම් හා උසස් ගතිගුණවලින් හෙබි පුරවැසියෙකු මෙන් ම සමාජ සත්වයකු බිහි කිරීම සාරධර්ම අධ්‍යාපනයේ මුඛ්‍ය පරමාර්ථය යි. සමාජගත පුද්ගලයෙකු විසින් තත්

හරවත් ධර්මරාශිය චරිතායනය කර ගැනීමෙන් සිදු වන්නේ තවත් සත්වයෙකුගේ මානව හිමිකම් සුරක්ෂිත වීමකි. සමාජ සංස්ථාගත අන්‍යොන්‍ය සබැඳියාව, ආදරය, කරුණාව, සහෝදරත්වය ආදී අවියෝජනීය බැඳීමක පදනම මෙම හරපද්ධතිය හා බැඳේ.

**පර්යේෂණ නිගමනය**

ශ්‍රී ලාංකේය සමාජය තුළ වාර්ගිකත්වය මත පදනම්ව මානව ප්‍රජාව අතර ගැටුම් ඇති වීම, අනෙකා පිළිබඳ අනවබෝධය, හීන වූ උත්සාහය මත දරිද්‍රතාව හා එවැනි කරුණු මත අතිරේක වූ ගැටලුකාරී තත්ත්වයන් ඇතිවීම ආදී වූ අනේකවිධ සමාජමය හා සංස්කෘතික ගැටලුවලට විසඳුම වන්නේ බෞද්ධ දර්ශනය හා ඒ මතින් ගොඩ නැගුණු බෞද්ධ සංස්කෘතියේ ඇති සාරධර්ම චරිතාභ්‍යන්තරීකරණයෙනි. එහි දී මෙත්ත සූත්‍රාගත සාරධර්ම විග්‍රහය ශිෂ්ට සමාජයකට අවැසි පදනම සපයයි.

**පර්යේෂණ යෝජනා**

මෙත්ත සූත්‍රාගත ධර්මකරුණු පිළිබඳ දීර්ඝ පර්යේෂණයක් සිදු කළ හැකි ය. එම කරුණු හුදෙක් ආශීර්වාදාත්මක සජ්ඣායනයකට පමණක් සීමා කළ නො හැක්කකි. චරිතායනය තුළින් අභ්‍යන්තරීකරණය කළ යුත්තකි. එය සාරධර්මවලින් සුපෝෂිත ජන සමාජයක් ගොඩ නැගීමට හේතු වේ. සමාජවිද්‍යාත්මක පර්යේෂණයක් කිරීම ඒ සඳහා වඩාත් සුදුසුයැයි යෝජනා කරමි.

**මුඛ්‍ය පද:** ශ්‍රී ලාංකේය, සමාජය, සාරධර්ම, මෙත්ත සූත්‍රය, බෞද්ධ, චරිතායනය

**මූලාශ්‍රය**

**ප්‍රාථමික මූලාශ්‍රය**

- **ඛුද්දකපාඨ** (1960, 20-23). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- විජයකිත්ති හිමි, මැදඋයන්ගොඩ (පරි.). (2009, 202-221). **පරමත්ථජෝතිකා නම් වූ ඛුද්දකපාඨට්ඨකථා (මෙත්ත සුත්තවර්ණනා).** දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**ද්විතීයික මූලාශ්‍රය**

- බාලසූරිය, ඒ.එස්. (1997, 45-54). **සාරධර්ම අධ්‍යාපනය.** පන්නිපිටිය: සංජීව ප්‍රකාශන.
- පෙරේරා, සරත් (2005, 84-86). **අපේ අධ්‍යාපනය හා සමාජ අවශ්‍යතා.** නිට්ටඹුව: නිව් සිටි ෆ්ලෙයාර් ප්‍රකාශන.

**පරිවාර උපලේඛන**

- කාරියවසම්, සී. (2002, 54-63). "සාරධර්ම අධ්‍යාපනයේ මූලිකාඞ්ග", **අධ්‍යාපනය 34.** (සංස්.). රෝලන්ඩ් අබේපාල. ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන සඞ්ගමයේ ප්‍රකාශන.